www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බ්‍රිතාන්‍ය ලේබර් පක්ෂය තුල අර්බුදය

**The crisis of British Labour**

**2009 ජුනි 11**

ලේබර් ආන්ඩුව තුල කට්ටිවාදී අභ්‍යන්තර ගැටුම පසුගිය 8 වන විට මුහුනට මුහුනලා පිහිටියේ ය. ඒ, ජනමාධ්‍යවල ද අනුබලය ලත් කැරලිකාරින් කන්ඩායමක් අගමැති ගෝඩන් බ්‍රවුන්ට පක්ෂ නායකත්වයෙන් ඉවත් වීමට බලකිරීමට දැරූ උත්සාහය අසාර්ථක වීමෙන් අනතුරුව ය.

එදින සවස විශේෂයෙන් කැඳවන ලද කම්කරු පක්ෂයේ පාර්ලිමේන්තු කන්ඩායමේ රැස්වීමක දී සිය විරුද්ධවාදීන්ට විවෘතව විරෝධය පෑමට බ්‍රවුන් සමත් විය. තමන් තනතුරෙන් පහකලහොත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ඉක්මන් මැතිවරනයකට මුහුනදීමට සිදුවනු ඇතැයි කල තර්ජනය මෙහි දී ප්‍රමුඛ විය.

ව්‍යවස්ථාමය වශයෙන් මහ මැතිවරනයක් පැවැත්වීමට අවශ්‍ය නොවුව ද, බ්‍රවුන් ඉවත් කිරීමෙන් පසුව අලුතින් පත් වන අයට මහා මැතිවරනයක් පැවැත්වීමෙන් වැලකී සිටීම ඉතා දුෂ්කර වනු ඇත. ටෝනි බ්ලෙයාර් සිය තනතුර අත්හල විට බ්‍රවුන් ඡන්දයකින් තොරව අගමැති විය. අනු කමිටුව දෙවැනි වරටත් ඡන්දයෙන් පත් නොකල ලේබර් පක්ෂයේ අගමැතිවරයෙකු දේශපාලන වශයෙන් පිලිනොගැනෙනු ඇතැයි සැලකේ.

ජූනි 7 දින පවත්වන ලද යුරෝපීය මැතිවරනයෙහි දී 1910 වසරින් අනතුරුව සිය අඩුම ඡන්ද ප්‍රමානය වාර්තා කල පක්ෂය බලාපොරොත්තු රහිත තත්ත්වයකට පත්වීමත් සමග ම, නායකත්වය සඳහා තරගයකට පාර්ලිමේන්තු මන්ත්‍රීන් 70කට අධික සංඛ්‍යාවකගේ සහාය ලබා ගැනීම සඳහා දැරූ ප්‍රයත්නයන් දීන ලෙස පරාජයට පත් විය. එසේ වුව ද, කට්ටිවාදී ගැටුම් බුරබුරා නැගෙමින් තිබෙන අතර බ්‍රවුන් මාරාන්තික ලෙස තුවාල ලබා ඇත. ඔක්තෝබරයෙහිදී පැවැත්වීමට නියමිත පක්ෂ සම්මේලනයෙහි දී එදිරිවාදිකම් යලි ඇරඹෙනු ඇතැයි බොහෝ විචාරකයෝ අනාවැකි පලකරති.

ඉදිරියේ දී කුමක් වුව ද, කම්කරු පක්ෂය අභ්‍යන්තරයෙහි කුනුවීමේ මුලු ප්‍රමානයමත්, එය මූලා කතිපයාධිකාරයේ දේශපාලන නිමැවුමක් බවට මුලුමනින්ම පරිවර්තනය වීමත් මෑත සතිවල සිදුවීම් හෙලිදරව් කොට ඇත.

කම්කරු පක්ෂ තන්ත්‍රය ඇතුලත ගැටුම මුලුමනින් ම පාහේ කේන්ද්‍රගත වූයේ කැබිනට් මන්ඩලයේ සාමාජිකයින් හා හිටපු ඇමතිවරුන් මත ය. බ්‍රවුන්ගේ සහායකයින් වුව ද හිටපු අගමැති බ්ලෙයාර් සමග වඩාත් සමීපව ඇසුරු කල අය වුව ද දශකයකට අධික කාලයක් තිස්සේ ලේබර් පක්ෂයෙහි දක්ෂිනාංශික ව්‍යාපාර ගැති න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමෙහි ලා මේ සියලු දෙනා මුඛ්‍ය භූමිකාවක් රඟපා ඇත. මේ කට්ටිවාදී අඬදබරයෙහි පෙරමුන ගත් මොවුන් කිසිවෙක්, ඉරාක යුද්ධයට හෝ ඇෆ්ගනිස්ථාන ආක්‍රමනයට හෝ "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" සමග එකට ගැටගැසුනු ප්‍රජාතන්ත්‍ර විරෝධී පියවර මාලාවට හෝ විරුද්ධ නොවී ය.

ලේබර් පක්ෂයට ඡන්ද දායකයන් පිටුපා ඇත්තේ නිශ්චිතව ම වසර ගනනාවක දේශපාලන පාවාදීම් සම්බන්ධයෙන් කලකිරුනු දස ලක්ෂ සංඛ්‍යාත වැඩ කරන ජනතාවක් පක්ෂය ප්‍රතික්ෂේප කිරීමේ හේතුවෙනි. ඔවුන් කම්කරු පක්ෂයට ඡන්දය දීමෙන් වැලකී සිටියේ (කොන්සර්වේටිව් පක්ෂයට) එය මූල්‍ය ප්‍රභූව නියෝජනය කිරීම සම්බන්ධයෙන් තත්වාරක්ෂකවාදීන්ට නොදෙවෙනි වන පක්ෂයක් බව නිගමනය කල බැවින් ය.

බ්‍රවුන් හෙලාදැකීමට ඉදිරිපත් වූ කිසිවෙක් ප්‍රතිපත්තිමය දේශපාලන උත්සුකයන් ගැන ඉඟියක් පවා කර නැත. ඒ වෙනුවට, බ්ලෙයාර් යටතේ සිය සේවයේ වසර ගනනාව තුල "නව කම්කරු පක්ෂය" හා එකට බැඳුන සියලු දෑ යලි ඇරඹීමට ඔවුහු උදක් බල කර සිටි අතර ඔවුන්ගේ ප්‍රහාර එල්ල කරන ලද්දේ හුදෙක්ම නායකයෙකු වශයෙන් බ්‍රවුන්ගේ පෞද්ගලික අඩුපාඩුකම්වලට එරෙහිව ය. තමන්ගේම ප්‍රතිපත්ති නියමයන් සවිස්තරව සඳහන් කිරීම පිලිබඳව ඔවුන් මුනිවත රැකීම පිටුපසින් ඇත්තේ, සිය න්‍යාය පත්‍රය මුලුමනින් ම අන කරනු ලබන්නේ ඩේලි ටෙලිග්‍රාෆ් හා අන් සියල්ලටමත් වඩා රූපට් මර්ඩොක්ගේ ප්‍රවෘත්ති

සංස්ථාව වැනි දක්ෂිනාංශික මාධ්‍ය මගින් ය යන කාරනයයි.

බ්‍රිතාන්‍යයෙහි බැංකුකරුවන් බේරා ගැනීම සඳහා බදු ගෙවන්නන්ගේ මුදල් බිලියන ගනනින් සැපයීමට ඇති සිය සූදානම සම්බන්ධයෙන් ආරම්භයේ දී මහා ව්‍යාපාරිකයින් බ්‍රවුන්ව උනුසුම් ලෙස ප්‍රශංසාවට ලක් කලද, ආර්ථිකය තව දුරටත් පසුබෑමට ලක් වී ඇති අතර ලොව ව්‍යවහාර මුදල් වෙලඳපොලවල පවුම ප්‍රපාතාකාර ලෙස පිරිහී ඇත. සීමා පැනවීමේ පියවර ගැනීම හා පොදු වියදම් බරපතල ලෙස කපා හැරීම් ක්‍රියාත්මක කිරීම සඳහා කෙරෙන කර්කශ ඉල්ලීම් මෙයින් ප්‍රකාශිත වෙයි. එම පියවර කම්කරු පන්තිය සමග බරපතල ගැටුමකට සූදානම් වීම අවශ්‍ය කරවයි.

කම්කරු පක්ෂයට කිසිදු පොදු ජන සහායක් නොමැති වීමත් බ්‍රවුන් තීරන ගැනීමට නොහැකි අයෙකු ලෙස පෙනී යාමත් සමග ම "සීමා පැනවීමේ යුගයක්" ඇති කිරීම පිලිබඳ ඩේවිඩ් කැමරන්ගේ නායකත්වයෙන් යුත් කොන්සර්වේටිව් පාක්ෂිකයන්ගේ කැපවීම උනුසුම් ලෙස අගය කර තිබේ. ආන්ඩුව අවමානයට ලක් කොට මහා මැතිවරනයක් කරා යෑමට, පාර්ලිමේන්තු මන්ත්‍රී කන්ඩායමක් විසින් ඉදිරිපත් කරන ලද අයුතු වියදම් ප්‍රකාශන පිලිබඳ හෙලිදරව් කිරීම් මාලාවක් උපයෝගී කොට ගැනීමට ටෙලිග්‍රාෆ් පුවත්පතේ මෙහෙයවීම යටතේ බලකිරීමේ උද්ඝෝෂනයක් ඇරඹී ඇත. එනමුදු, මෙය ටෝරිවරුන් මෙන් ම පාර්ලිමේන්තුව ද අපකීර්තියට පත් කිරීමට තර්ජනය කරන මොට්ට ආයුධයක් ද වෙයි.

එසේ වුව ද, සැලකිය යුතු පාර්ලිමේන්තු බහුතරයක් තවමත් කම්කරු පක්ෂය සතු තත්ත්වයක් යටතේ එවන් විකල්පයකට ඇති ඉඩකඩ අල්ප බව ද පෙනීගියේ ය. 2010 මාර්තු තෙක් මැතිවරනයක් කැඳවීමට බ්‍රවුන්ට අවශ්‍යවන්නේ නැත. මේ ගැටලු ජයගැනීම සඳහා බ්‍රවුන් පිටමං කිරීමේ ආයාසය වෙනුවෙන්, කම්කරු පක්ෂයෙහි නායකත්වය තුල ඇතැමුන් රැලි කරගැනීමේ ප්‍රයත්නයක් තිරයෙන් පිටුපසස සිදුවෙමින් තිබුනි.

මර්ඩොක්ගේ ආධාරය අහිමිවීමේ තත්ත්වයක් තුල පක්ෂයෙන් කොටසක් ඒ සඳහා සහාය දැක්වීමට ඕනෑවටත් වඩා කැමැත්ත දක්වති. ඉහලම බදු අනුපාතිකය සියයට 50ක ප්‍රතිශතයකට නැවීමට බ්‍රවුන් විසින් ගන්නා ලද තීරනය පිලිබඳව ඔහු හෙලා දකින ව්‍යාපාරයක් දියත් කරන ලදී. එම ව්‍යාපාරය තව දුරටත් ඉදිරියට ගෙන යන ලද්දේ ඉහල ප්‍රසිද්ධියක් උසුලන අමාත්‍යවරුන්ගේ ඉල්ලා අස් වීමේ මාලාවක් තුලිනි. ඉතාම සුදුසු වේලාවේ ක්‍රියාවට නැංවීම මෙය ඉලක්ක කර තිබුනේ එලැඹෙන පලාත් පාලන සභා හා යුරෝපීය මැතිවරන සමයෙහි බ්‍රවුන්ගේ අගමැති කම අස්ථායී කිරීමයි. ඉල්ලා අස්වූ සෑම ඇමතිවරයෙකුම පාහේ ලේබර් ය. දැවැන්ත ලෙස අපකීර්තියට පත්කිරීමට වගකිවයුතු වූවන් මූලික වගකීම පැවරුයේ බ්‍රවුන් මත ය.

මර්ඩොක් සමග තිබූ දූස්සන්ධානයෙහි තරම පෙනී ගියේ කාර්ය සාධන හා විශ්‍රාම වැටුප් භාර ලේකම් ජේම්ස් හර්නල්ගේ නික්මයාම තුලිනි. මර්ඩොක්ගේ *ටයිම්ස්* හා *සන්* පුවත්පත්වලට හර්නල්ගේ ඉල්ලා අස්වීමේ ලිපිය රහසේ කාන්දු කරන ලදී.

කුමන්ත්‍රනකරුවන්ට ඇතිවූ ගැටලුව, මෙය තමන්ට දේශපාලන වශයෙන් දිවිනසා ගැනීමට කෙරෙන ආරාධනයකැයි පාර්ලිමේන්තුවේ කම්කරු පක්ෂය තුල ක්‍රමයෙන් එලිදරව් වී හඳුනාගැනීමට පටන් ගැනීම යි. බ්‍රවුන් වෙනුවට පත්කර ගත යුතු යැයි පිලිගැනීමට ලක්ව සිටි ඇලන් ජොන්සන් ද ඇතුලුව, කිසිවෙකුත් ක්ෂනික අභියෝගයක් දියත් කිරීමට සූදානමක් නැති බවට මේ පිලිගැනීමෙන් සහතික වුනි. ඒ වෙනුවට, තමා අනාගත දිනයක දී පක්ෂ නායක වීම ගැන සලකා බලන බවට ජනමාධ්‍යවලට පවසන අතර ජොන්සන් බ්‍රවුන්ගේ ඇමති මන්ඩලය යලි සැකසීමේදී ස්වදේශ කටයුතු භාර තනතුර පිලිගත්තේ ය.

බ්‍රවුන් බේරාගැනීම තුල ඉතාමත් කැපීපෙනෙන භූමිකාව රඟපාන ලද්දේ හිටපු ව්‍යාපාර ලේකම් පීටර් මැන්ඩෙල්සන් විසිනි. නව කම්කරු පක්ෂ ව්‍යාපෘතියෙහි බුද්ධිමය නිර්මාපකයා අන් කිසිදු පුද්ගලයෙකු නොව තමා බව මැන්ඩල්සන්ට ප්‍රකාශ කල හැක. බ්‍රවුන් විරෝධී කුමන්ත්‍රනකරුවන්ගේ මූලාවන් කුමන ඒවා වුවද, බ්‍රවුන් විරෝධී කුමන්ත්‍රනකරුවන් තුල කුමන මිත්‍යාවන් පැවතිය ද මෙහි පරදුවට තබා ඇත්තේ බ්‍රවුන්ගේ අගමැතිකමට වැඩි යමකැයි ඔහු අවබෝධ කර ගත්තේ ය.

"නව ලේබර් පක්ෂය මුහුනු පිබඳ ප්‍රශ්නයක් නොව, ප්‍රතිපත්ති පිලිබඳ ප්‍රකාශයකි"යි ඔහු ප්‍රකාශ කලේ ය. වර්තමාන තත්ත්වයන් යටතේ බ්‍රවුන් බලයෙන් පහවුව හොත් පක්ෂය වේගයෙන් කැඩී බිඳී යනු ඇතැයි මැන්ඩෙල්සන් ගනන් බැලීය. ඊට වැඩිමනත්ව, වෙස්ට්මිනිස්ටර්වල හා පටු කවයන්ගෙන් පිටස්තරව, කම්කරු පක්ෂයෙහි පවත්නා අර්බුදයෙහි එකම නිර්මාපකයා බ්‍රවුන් බව කිසිවෙක් විශ්වාස නොකලහ. නව නායකයෙකු යටතේ පක්ෂය යලි ප්‍රකෘති තත්වයට පත්වීමේ සැබෑ අපේක්ෂාවක් ඇති කර ගත හැකි බවක් ද ඔවුහු විශ්වාස නොකරති.

පක්ෂය තුල ක්ෂනික අභ්‍යන්තර පිපිරීමක් වලකාලීම සඳහාත් මර්ඩොක් හා ඔහුගේ පරිවාරකයන් සමග කම්කරු පක්ෂයේ සන්ධානය යලි පිහිටුවීමේ අපේක්ෂාවෙන් කල් ගැනීම සඳහාත් දේශපාලන බිඳවැටීමක් පිලිබඳව බියට පත් සියල්ලන්ගේ ම ලිහිල් සන්ධානයක් මැන්ඩෙල්සන් විසින් එකට ගැටගසන ලදී.

අවශ්‍ය එකම කාරනය වූයේ සැලසුම් කරන ලද රාජ්‍ය තැපැල් සේවයේ පෞද්ගලීකරනය ප්‍රමාද කිරීම සඳහා අපැහැදිලි ප්‍රතිඥාවක් දීමක් පමනි. එය ද අපේක්ෂිත මුදලට වඩා ලන්සු පහත වැටුනොත් පමනි. ඊට පසු දින, සන්නිවේදන කම්කරුවන්ගේ වෘත්තීය සමිතිය කාර්මික ක්‍රියාකාරකම් පිලිබඳව තෙමසක තාවකාලික තහනමක් ක්‍රියාත්මක කිරීමේ වැඩ පිලිවෙලක් ආන්ඩුවට පිලිගැන්වීය. එසේ කලේ ඡන්ද විමසුමේ දී වැඩ වර්ජනයකට පක්ෂව ලන්ඩනයෙහිදී නවයට එකකින් ලත් ඡන්ද ප්‍රතිපලය උඩුයටිකුරු කරමිනි.

මැන්ඩෙල්සන් පලමු රාජ්‍ය ලේකම් වශයෙන් ප්‍රකාශයට පත් කොට ඇත. එය ගෞරව වාචී පදවි නාමයක් පමනක් වුව ද, ඉන් ගම්‍යවන්නේ, අගමැති හැරුනුවිට, ආන්ඩුවෙහි අන් සියලු සාමාජිකයින්ට ඉහලින් ඔහු ස්ථානගතවී සිටින බවයි. බ්‍රවුන් කෙසේ හෝ තම විරුද්ධවාදීන්ට වඩා වමට බර පුද්ගලයෙකු යයි කෙරෙන ප්‍රකාශය සම්පූර්නයෙන් බොරු බවට හොඳම සාධකය මැන්ඩෙල්සන්ගේ උසස්වීමයි. මැන්ඩෙල්සන් වූකලි මිනිසුන් "කැතවිධිහට පොහොසත් වීම" ගැන නව ලේබර් පක්ෂය "අතිශයින්ම සැහැල්ලු" සිතින් බලන බවට ප්‍රකාශ කල පුද්ගලයාය.

එකිනෙකාට විරුද්ධව සටන් වදින කල්ලි තුලින් පාර්ලිමේන්තු ලේබර් පක්ෂය කැඩී බිඳී යාම වැලැක්වීම සඳහා අර්ධ-බොනපාට්වාදී පුද්ගලයෙකු වශයෙන් මැන්ඩෙල්සන් අවශ්‍යවේ. එනමුදු, මේ ගැටුමට පැටලී ඇත්තේ සුපිරි ධනවතුන්ගේ දේශපාලන වාසි සඳහා තරග කරන ඒකාකාර දක්ෂිනාශික කොටස් ය. කම්කරු පක්ෂයෙහි දියවී යාම තව දුරටත් වේගවත් වන බවට මෙය පමනක් ම වුව ත් සහතිකයකි.

කම්කරු පන්තිය පැත්තෙන් බලන කල, කම්කරු පක්ෂය දැනටමත් මියගොස් ය. වැඩ කරන ජනතාව වෙනුවෙන් නව සමාජවාදී නායකත්වයක් ඉතා හදිසියෙන් අවශ්‍යව ඇත. මෙම නායකත්වය නොමැතිව, දේශපාලන ජීවිතයෙන් වැඩ කරන ජනතාව මුලුමනින් ම ඉවත් කර තැබීම තුලින් නිර්මානය කර ඇති රික්තය, දක්ෂිනාංශය තව දුරටත් උපයෝගි කර ගනු ඇත.

**ක්‍රිස් මාස්ඩන් විසිනි.**

© www.wsws.org